27/07/2010 - ලංකාදීප

**තොරතුරු දැනගැනීමේ අයිතිය: පාඨයකුගේ අදහසක්**

(රවින්ද්‍ර කන්නන්ගර)

ලංකාදීප පුවත්පතේ 2010.06.26 වැනි දින කතුවැකිය ඉතා කාලෝචිත එමෙන්ම රටට වැදගත්වන පණිවුඩයක්, තොරතුරු දැනගැනීමේ අයිතිය පණතට සහාය දීම කාගේත් යුතුකමක් යනුවෙන් ලියා තිබිණි. මෙහි අඩංගු කාරණා කෙරෙහි සම්පූර්ණ අනුමැතිය පළකරන අතර මෙම තොරතුරු දැනගැනීමේ අයිතය සම්බන්ධව තවත් ගිලිහී ගොස් තිබුනු වැදගත් කාරණාවක් මතු කිරීමට කැමැත්තෙමි.

2010 වසරේ මහ මැතිවරණය අවස්ථාවේ කොළඹ දිස්ත්‍රික්කයෙන් ඉදිරිපත්වූ ශ්‍රී ලංකා ජාතික සංගමයේ නායක මිලින්ද මොරගොඩ මහතා අප අතට කරුණු දොළහකින් සමන්විත න්‍යාය පත්‍රයක් සිය මැතිවරණ ප්‍රකාශනය ලෙස ඉදිරිපත් කළේය. ආරම්භයේ සිටම පෝස්ටර් අලවමින් හා කටවුට් ප්‍රදර්ශනය කරමින් කරන දේශබාලනයෙන් ඉවත්ව ක්‍රියා කල ඒ මහතා සැබවින්ම නිහඬව බුද්ධිමත් ඡන්දදායකයන්ට කෙලින්ම ඇමතීමට උත්සාහ කළේය.

පැවති මැතිවරණයේදී බෙදා දුන් ඔහුගේ න්‍යාය පත්‍රයේ දේශපාලන සදාචාරය, දේශපාලනයේ කාන්තා නියෝජනය වැඩි කිරීම, විදේශයන්හි සිටින ශ්‍රී ලාංකිකයන්ට ඡන්ද අයිතිය ලබාදීම වැනි ප්‍රමුඛ අවධානය යොමු විය යුතු කාරණා ගණනාවක් අතර මහජනතාවට තොරතුරු දැනගැනීමේ අයිතිය හිමිවිය යුතු බවට සඳහන් යෝජනාවක් ද එම කරුණු දොළහ ඇතුළත තුන්වැනි කරුන වශයෙන් දක්වා තිබිණි. මහින්ද චින්තනය ඉදිරි දැක්ම වැඩපිළිවෙළ ඇතුළත මෙයද ඇතුලත් තමන් ඉදිරිපත් කරන ලද යෝජනා ක්‍රියාත්මක කරන්නට ඔබේ සහාය අවශ්‍ය වන බව එහි දන්වන අතර තොරතුරු දැනගැනීමේ අයිතිය තහවුරු කරන යෝජනාව ගැඹුරින් අධ්‍යයනය කර එහි කෙටුම්පතක් සකස් කළ බව ද මාධ්‍ය මගින් අනාවරණය කළේය. සියලු භාෂා නියෝජනය කරන ජ්‍යෙෂ්ඨ පුවත්පත් කතුවරුන්, නීති ක්ෂේත්‍රයේ අත්දැකීම් ඇති පිරිස් හා සමාජ නායකයන් පෙනී සිටි මෙම කමිටුව විසින් සකස් කළ කෙටුම්පතෙහි අන්තර්ගතය ඇතුළත් ලිපි ලංකාදීප හා සන්ඩේ ටයිම්ස් ඇතුළු පුවත්පත්වලද මේ දිනවල පළ විය. දේශපාලනයෙන් තොරව ජාතික අවශ්‍යතාවයක් සේ සලකා මෙම පනත වෙනුවෙන් ක්‍රියා කරන්නට මෙම කමිටුවට හැකි වේවායි අපගේ අදහසයි. ඉන්දියාව මෑතකදී තොරතුරු දැනගැනීමේ අයිතිය පාර්ලිමේන්තුවේ සම්මත කර එහි ප්‍රයෝජන ඉන්දියානු පුරවැසියන්ට ලබා දී ඇත. යුරෝපය හා බටහිර රටවල් අද මේ අයිතිය පිළිගෙන තිබේ. එහෙයින් විපක්ෂනායකතුමා මෙන්ම මෙම සියලුදෙනා තොරතුරු දැන ගැනීමේ අයිතිය වෙනුවෙන් පෙනී සිටීම වැදගත්ය.

මිලින්ද මොරගොඩ මහතාගේ අරමුණ වූයේ වංචා දූෂණ සම්බන්ධයෙන් පුන පුනා කතා කරමින් සිටිනවාට වඩා මහජනතාවගේ බදු ආදායම වැය කරන අන්දම මහජනතාවටම ප්‍රශ්න කර තොරතුරු දැනගැනීමට අයිතියක් හිමිවිය යුතු හා එය ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීමට මහඟු පිටිවහලක් වන බව යැයි එම ලිපි කියවන විට මට ඇතිවූ අදහසයි. පක්ෂ විපක්ස දේශපාලනයෙන් තොරව මහජන යහපත උදෙසා මෙවැනි යහපත් නීති රීති රටට හඳුන්වාදීම වැදගත්ය. එයින් ආරක්ෂා වන්නේ ප්‍රජාතන්ත්‍රවාදයයි. මහජනතාවගේ මුදල් වැය වන අන්දම ගැන විනිවිද භාවයකින් දැන ගත හැකි නම්, එය නිලධාරීන් හා මහජන නියෝජිතයන්ගේ හැසිරීම ගැන පවතින අසත්‍ය හා චරිත ඝාතන

වළක්වා සත්‍යය දැන ගැනීමට ඉඩ සලසයි. ලංකාදීප කතුතුමන්ගේ අදහස අනුවම යමින් තොරතුරු දැනගැනීමේ අයිතිය පණාතට සහාය දීම අප කාගේත් යුතුකමක් හා වගකීමක් බව මෙහිලා දක්වනු කැමැත්තෙමි.